සියලු ම හිමිකම් ඇවිරිණි
All rights reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Department of Education Southern Province**

4216

තුන්වන වාර පරීක්ෂණය 2023
**Third Term Test 2023**


| 11 ශ්‍රේණිය<br>Grade 11 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I<br>Information and Communication Technology I | පැය තුනයි<br>Three hours |
|---|---|---|

## පළමු කොටස

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 01-40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙකුත් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.


1. තොරතුරු පද්ධතියක් පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
    1) දත්ත ගබඩා කිරීම වැදගත් කාර්යයකි.
    2) ලබා දෙන දත්ත, අපගේ විධානයන්ට අනුව සැකසේ.
    3) තොරතුරු ලබාදීමේ දී හැමවිටම ආදානය කරන දත්ත පමණක් භාවිතා වේ.
    4) සකසන ලද දත්ත, අවශ්‍ය ආකාරයට ප්‍රතිදානය කරයි.

2. පහත දැක්වෙන්නේ මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රවේශ සබැඳියන් කිහිපයකි. තමන් ගේ ඡන්ද හිමි නාමලේඛන තොරතුරු ලබාගැනීම G2C පහසුකමකි. ඒ සඳහා භාවිතාකළ යුතු සබැඳිය දැක්වෙන අක්ෂරය කවරක් ද?




1) A  2) B  3) D  4) E

3.




ඊ-හිස් මගින් A, B, C සහ R, Q, P පිළිවෙළින් වැඩි අගයක් පෙන්නුම් කරයි නම්, විදුලිය භාවිතය අඩුවීම සහ සැකසුම් කාර්යක්ෂමතාව සලකමින් A, B, C හා R, Q, P ස්ථානවලට ගැලපෙන ප්‍රධාන දෘඩාංග තාක්ෂණය පිළිවෙළින් නම් කරන්න.

1) A-රික්තක නල R-අනුකලිත පරිපථ, B-ට්‍රාන්සිස්ටර් Q - ට්‍රාන්සිස්ටර්, C -අනුකලිත පරිපථ P-රික්තක නල
2) A-අනුකලිත පරිපථ R -අනුකලිත පරිපථ, B-ට්‍රාන්සිස්ටර් Q - ට්‍රාන්සිස්ටර්, C- රික්තක නල P-රික්තක නල
3) A-රික්තක නල R - රික්තක නල, B-ට්‍රාන්සිස්ටර් Q - ට්‍රාන්සිස්ටර්, C- රික්තක නල P-රික්තක නල
4) A-රික්තක නල R - රික්තක නල, B-අනුකලිත පරිපථ Q - ට්‍රාන්සිස්ටර්, C- රික්තක නල P-රික්තක නල

14. පැතුරුම්පත් කෝෂයකට =3*(2+4)/9+1 යන සූත්‍රය ඇතුළත් කරන ලදී. කෝෂයේ දිස්වන අගය කුමක් ද?

1) 1.8 2) 3 3) 1 4) 18

*15 සිට 17 දක්වා ප්‍රශ්න සඳහා පහත පැතුරුම්පත් කොටස සලකන්න.

QR කේත මගින් ඉන්ධන ලබා දෙන පිරවුම්හලක QR කේතය හා සම්බන්ධ කර සකසන ලද ඉලෙක්ට්‍රොනික පැතුරුම්පතක කොටසක් පහත දැක්වේ. ඉන්ධන ලබා ගැනීමට පැමිණෙන රථය හිමිකරුගේ QR කේතය කියවීම සමඟ පැතුරුම්පතේ A තීරුව ස්වයංක්‍රීයව සම්පූර්ණ වේ.

| | A | B | C |
|---|---|---|---|
| 1 | ලබාගන්නා ප්‍රමාණය | ලීටරයක මිල | ඉන්ධන සඳහා මිළ |
| 2 | 3 | Rs 470.00 | Rs 1,410.00 |
| 3 | 16 | | Rs 7,520.00 |
| 4 | 15 | | Rs 7,050.00 |
| 5 | 12 | | Rs 5,640.00 |
| 6 | 10 | | Rs 4,700.00 |
| 7 | 14 | | Rs 6,580.00 |
| 8 | 13 | | Rs 6,110.00 |
| 9 | | | |

15. පැතුරුම් පත මගින් අදාල ඉන්ධන වලට වැයවන මිල පහසුවෙන් ගණනය වේ. වැයවන මුදල ඕනෑම ලිටර් ගණනකට ගැලපෙන පරිදි ලබා ගැනීමට C2 සඳහා ලියන සූත්‍රය වන්නේ කුමක් ද?

1) =A2*B2 2) =A$2*B$2
3) =A$2*B2 4) =A2*B$2

16. ඉන්ධන ලබාගත් වාහන සංඛ්‍යාව ගණනය කිරීමට A9 කෝෂයට ලියූ සූත්‍රය දැක්වෙන්නේ කවර පිළිතුරකින් ද?

1) =max(A2:A8) 2) =count(A2:A8) 3) =min (A2:A8) 4) =sum(A2:A8)

17. C2: C8 කෝෂ පරාසය තුළ ඉන්ධන සඳහා ගෙවූ වැඩිම මිල සෙවීමට ලිවිය යුතු සූත්‍රය වන්නේ කවරක් ද?

1) =count(C2:C8) 2) =min (C2:C8) 3) =max(C2:C8) 4) =min (C2:C8)

18. සමර්පණ මෘදුකාංග සම්බන්ධව සත්‍ය ප්‍රකාශ/ය අඩංගු පිළිතුර වන්නේ,

A- F5 යතුර භාවිතා කළවිට හැම විටම නැරඹුම් අවස්ථාව, ආරම්භක කදාවේ සිට ම ක්‍රියාත්මක වේ.
B- කදාවක ඇති වස්තුවකට ඇතුළත් කළ හැක්කේ එක් සජීවිකරණයක් පමණි
C- ඇතැම් සමර්පණ මෘදුකාංග සංස්කරණවල දී සමර්පණ කදා වීඩියෝවක් බවට පත්කළ හැක.

1) A 2) B සහ C පමණි. 3) A සහ C පමණි. 4) A, B සහ C සියල්ලම

19. විද්‍යුත් සමර්පණ මෘදුකාංගයක් ප්‍රදර්ශණ අවස්ථාවේ දී W අක්ෂරය සහ කොමාව (,) පිළිවෙලින් භාවිතා කළ විට ලැබෙන ප්‍රතිඵලය වනුයේ,

1) හිස් සුදු කදාව, පෙර කදාව 2) හිස් කළු කදාව, පෙර කදාව
3) හිස් සුදු කදාව, පසුකදාව 4) හිස් කළු කදාව, පසු කදාව

ප්‍රශ්න අංක 20 සිට 23 පහත පෙන්වා ඇති දත්ත සමුදාය, වගු කොටස් මත පාදක වී ඇත. මෙම වගු පාසලක මේ දිනවල පැවැත්වෙන වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා තරගයක ක්‍රීඩා, කාලසටහන් සහ ශිෂ්‍ය නිවාස පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

ශිෂ්‍ය වගුව

| Player_NO | Student_Name |
|---|---|
| 1001 | LAKMAL |
| 1002 | SURAJ |
| 1003 | THARAKA |
| 1004 | NADEEKA |
| 1005 | JANITH |
| 1006 | NIMASHA |

කාලසටහන් වගුව

| Player_NO | Game_No | Date |
|---|---|---|
| 1001 | S002 | 2023/02/10 |
| 1003 | S003 | 2023/02/12 |
| 1004 | S005 | 2023/02/10 |
| 1003 | S005 | 2023/02/10 |

14. පැතුරුම්පත් කෝෂයකට =3*(2+4)/9+1 යන සූත්‍රය ඇතුළත් කරන ලදී. කෝෂයේ දිස්වන අගය කුමක් ද?
1) 1.8 2) 3 3) 1 4) 18

*15 සිට 17 දක්වා ප්‍රශ්න සඳහා පහත පැතුරුම්පත් කොටස සලකන්න.

QR කේත මගින් ඉන්ධන ලබා දෙන පිරවුම්හලක QR කේතය හා සම්බන්ධ කර සකසන ලද ඉලෙක්ට්‍රොනික පැතුරුම්පතක කොටසක් පහත දැක්වේ. ඉන්ධන ලබා ගැනීමට පැමිණෙන රථය හිමිකරුගේ QR කේතය කියවීම සමඟ පැතුරුම්පතේ A තීරුව ස්වයංක්‍රීයව සම්පූර්ණ වේ.

| | A | B | C |
|---|---|---|---|
| 1 | ලබාගන්නා ප්‍රමාණය | ලීටරයක මිල | ඉන්ධන සඳහා මිළ |
| 2 | 3 | Rs 470.00 | Rs 1,410.00 |
| 3 | 16 | | Rs 7,520.00 |
| 4 | 15 | | Rs 7,050.00 |
| 5 | 12 | | Rs 5,640.00 |
| 6 | 10 | | Rs 4,700.00 |
| 7 | 14 | | Rs 6,580.00 |
| 8 | 13 | | Rs 6,110.00 |
| 9 | | | |

15. පැතුරුම් පත මගින් අදාල ඉන්ධන වලට වැයවන මිල පහසුවෙන් ගණනය වේ. වැයවන මුදල ඕනෑම ලිටර් ගණනකට ගැලපෙන පරිදි ලබා ගැනීමට C2 සඳහා ලියන සූත්‍රය වන්නේ කුමක් ද?
1) =A2*B2 2) =A$2*B$2
3) =A$2*B2 4) =A2*B$2

16. ඉන්ධන ලබාගත් වාහන සංඛ්‍යාව ගණනය කිරීමට A9 කෝෂයට ලියූ සූත්‍රය දැක්වෙන්නේ කවර පිළිතුරකින් ද?
1) =max(A2:A8) 2) =count(A2:A8) 3) =min (A2:A8) 4) =sum(A2:A8)

17. C2: C8 කෝෂ පරාසය තුළ ඉන්ධන සඳහා ගෙවූ වැඩිම මිල සෙවීමට ලිවිය යුතු සූත්‍රය වන්නේ කවරක් ද?
1) =count(C2:C8) 2) =min (C2:C8) 3) =max(C2:C8) 4) =min (C2:C8)

18. සමර්පණ මෘදුකාංග සම්බන්ධව සත්‍ය ප්‍රකාශ/ය අඩංගු පිළිතුර වන්නේ,

A- F5 යතුර භාවිතා කළවිට හැම විටම නැරඹුම් අවස්ථාව, ආරම්භක කදාවේ සිට ම ක්‍රියාත්මක වේ.
B- කදාවක ඇති වස්තුවකට ඇතුළත් කළ හැක්කේ එක් සජීවිකරණයක් පමණි
C- ඇතැම් සමර්පණ මෘදුකාංග සංස්කරණවල දී සමර්පණ කදා වීඩියෝවක් බවට පත්කළ හැක.

1) A 2) B සහ C පමණි. 3) A සහ C පමණි. 4) A, B සහ C සියල්ලම

19. විද්‍යුත් සමර්පණ මෘදුකාංගයක් ප්‍රදර්ශණ අවස්ථාවේ දී W අක්ෂරය සහ කොමාව (,) පිළිවෙලින් භාවිතා කළ විට ලැබෙන ප්‍රතිඵලය වනුයේ,
1) හිස් සුදු කදාව, පෙර කදාව
2) හිස් කළු කදාව, පෙර කදාව
3) හිස් සුදු කදාව, පසුකදාව
4) හිස් කළු කදාව, පසු කදාව

ප්‍රශ්න අංක 20 සිට 23 පහත පෙන්වා ඇති දත්ත සමුදාය, වගු කොටස් මත පාදක වී ඇත. මෙම වගු පාසලක මෙ දිනවල පැවැත්වෙන වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා තරගයක ක්‍රීඩා, කාලසටහන් සහ ශිෂ්‍ය නිවාස පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

ශිෂ්‍ය වගුව

| Player_NO | Student_Name |
|---|---|
| 1001 | LAKMAL |
| 1002 | SURAJ |
| 1003 | THARAKA |
| 1004 | NADEEKA |
| 1005 | JANITH |
| 1006 | NIMASHA |

කාලසටහන් වගුව

| Player_NO | Game_No | Date |
|---|---|---|
| 1001 | S002 | 2023/02/10 |
| 1003 | S003 | 2023/02/12 |
| 1004 | S005 | 2023/02/10 |
| 1003 | S005 | 2023/02/10 |

ක්‍රීඩා වගුව

| Game_No | Game_Name | Playground_Name |
|---|---|---|
| S001 | Marathon | A17 main road |
| S002 | Cricket | Galle Cricket Stadium |
| S003 | Under 15 women's 100m swimming | School swimming pool |
| S004 | Under 15 100m Men's Race | School stadium |
| S005 | Under 19 Women's Badminton Tournament | School Indoor stadium |

20. කාලසටහන් වගුවේ ප්‍රාථමික යතුර වන්නේ කුමක් ද?
    1) Player_NO  2) Game_No  3) Player_NO + Game_No  4) Game_No+ Date

21. මෙම දත්ත සමුදාය වගුවේ ආගන්තුක යතුරක් වනුයේ කුමක් ද?
    1) ක්‍රීඩා වගුවේ Game_No  2) ශිෂ්‍ය වගුවේ Player _NO
    3) කාලසටහන් වගුවේ Date  4) කාලසටහන් වගුවේ Game _No

22. LAKMAL මැරතන් තරගයට අමතරව ක්‍රිකට් තරගය සඳහා ද යොමු කිරීමට ඔහුගේ නිවාස භාර ආචාර්ය මණ්ඩලය කටයුතු කරයි. සංවිධායකයින් යාවත්කාලීන කළ යුත්තේ කවර වගු ද?
    1) ශිෂ්‍ය වගුව සහ කාලසටහන් වගුව  2) කාලසටහන් වගුව
    3) ශිෂ්‍ය වගුව සහ ක්‍රීඩා වගුව  4) ක්‍රීඩා වගුව සහ කාලසටහන් වගුව

23. ක්‍රීඩා වගුවේ ක්ෂේත්‍ර ගණන සහ රෙකෝඩ ගණන පිළිවෙළින්,
    1) 3, 5  2) 5, 3  3) 3, 15  4) 5, 3

24. දකුණුපස දැක්වෙන ආකාරයට පාඨ කොටසක් ප්‍රදර්ශනය සඳහා නිවැරදි HTML උසුලනය වන්නේ,



    1) <P align = justify>  2) <P align =" justify">
    3) <P align = Center>  4) <P align = "Center">

25. දකුණු පස දැක්වෙන උසුලන කොටස සලකන්න.
    එහි නිවැරදි ප්‍රතිදානය දැක්වෙන පිළිතුර කවරක් වන්නේ ද?

```
<ul type= "circle" >
 <li>Coffee</li>
 <li>Tea</li>
 <li>Milk</li>
</ul>
```

1)
- ○ Coffee
- ○ Tea
- ○ Milk

2)
- ▪ Coffee
- ▪ Tea
- ▪ Milk

3)
- • Coffee
- • Tea
- • Milk

4)
Coffee
Tea
Milk

26. වගුවක් නිර්මාණය සඳහා පහත HTML වගන්තිය සලකා බලන්න. එහි ප්‍රතිදානය ලෙස නිර්මාණය වන නිවැරදි වගුව වනුයේ,

```
<table border="2">
<tr> <th colspan="2">main beneficiary stakeholder{s} Wisdom Cloud LMS</th> <th>Total</th> </tr>
<tr> <td>Student</td> <td>500000</td> <td rowspan="4">530450</td> </tr>
<tr> <td>Teachers</td> <td>30000</td> </tr>
<tr> <td>Teachers educators</td> <td>250</td> </tr>
<tr> <td>education administrators</td> <td>250</td> </tr>
</table>
```

1).

<table>
<tr><th colspan="2">main beneficiary stakeholder{s} Wisdom Cloude LMS</th><th>Total</th></tr>
<tr><td>Student</td><td>500000</td><td rowspan="4">530450</td></tr>
<tr><td>Teachers</td><td>30000</td></tr>
<tr><td>Teachers educators</td><td>250</td></tr>
<tr><td>education administrators</td><td>250</td></tr>
</table>

2).

<table>
<tr><th colspan="2">main beneficiary stakeholder{s} Wisdom Cloude LMS</th><th></th></tr>
<tr><td>Student</td><td>500000</td><td rowspan="4">530450</td></tr>
<tr><td>Teachers</td><td>30000</td></tr>
<tr><td>Teachers educators</td><td>250</td></tr>
<tr><td>education administrators</td><td>250</td></tr>
</table>

3).

<table>
<tr><th colspan="2">main beneficiary stakeholder{s} Wisdom Cloude LMS</th><th>Total</th></tr>
<tr><td>Student</td><td>500000</td><td rowspan="2">530450</td></tr>
<tr><td>Teachers</td><td>30000</td></tr>
<tr><td>Teachers educators</td><td>250</td><td></td></tr>
<tr><td>education administrators</td><td>250</td><td></td></tr>
</table>

4).


<table>
<tr><th colspan="2">main beneficiary stakeholder{s} Wisdom Cloude LMS</th><th>Total</th></tr>
<tr><td>Student</td><td>500000</td><td>530450</td></tr>
<tr><td>Teachers</td><td>30000</td><td></td></tr>
<tr><td>Teachers educators</td><td>250</td><td></td></tr>
<tr><td>education administrators</td><td>250</td><td></td></tr>
</table>

27. <img src="img_girl.jpg" alt="Girl in a jacket" width="500" height="600"> යන HTML උසුලන ගුණාංග ඇතුළත් වගන්තිය සලකන්න. එහි src සහ alt ගුණාංග වල කාර්යයන් වන්නේ,
   1). src -රූපය අඩංගු ගොනුව නාමය සහ දිගුව රැඳවීම, alt- src මගින් දක්වන රූප නොමැති විට දර්ශනය කළයුතු පාඨ කොටස රැඳවීම.
   2). src -රූපය නාමය රැඳවීම, alt -රූපය පවතින ස්ථානයේ දිගුව සටහන් කළ යුතු ය.
   3). src -රූපය අඩංගු ගොනුව නාමය සහ දිගුව රැඳවීම, alt- රූපයේ දිග සහ පළල දැක්වීම
   4). src- රූපයේ දිග සහ පළල alt -රූපය පවතින ස්ථානයේ දිගුව සටහන් කළ යුතුය.

28. වෙබ් අඩවියක සන්ධාර ස්වභාවය පිළිබඳ පහත ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශ/ය දක්වන පිළිතුර තෝරන්න.
   A. සන්ධාරය ස්ථාවර ලෙස යම්කිසි කාලයක් පවත්වාගන යන වෙබ් අඩවි ස්ථිතික වෙබ් අඩවි ලෙස හැඳින්වේ.
   B. CMS මෘදුකාංගයක් ස්ථාපනයට පෙර APACHE, PHP, MySQL පරිගණකයට ස්ථාපනය කළ යුතුය.
   C. CMS භාවිතාකරන වෙබ් අඩවි HTML, PHP වැනි භාෂා දැනුම භාවිතා කර ආකෘතිකරණය කළ නොහැක.
   1). A පමණි 2). B සහ C පමණි 3). A සහ B පමණි 4). A, B සහ C සියල්ලම

29. දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සිය අභ්‍යන්තර මෙහෙයුම් කළමනාකරණය සඳහා E-Office නමින් ඉලෙක්ට්‍රොනික පද්ධතියක් හඳුන්වා දී ඇත. මෙම පද්ධතියේ, "ලැබෙන සහ යවන ලිපි-කළමණාකරන පද්ධතිය (mailroom management system)", "ආගන්තුකයින් කළමණාකරණ මෘදුකාංග (**Visitor Management Tool)" හා "කාර්යාල කාර්යක්ෂමතාව ඉහල නවන මෘදුකාංග ( Office Productivity Software)" යනුවෙන් මොඩියුල කිහිපයක් පවතී.** ආරම්භයේ දී "ලැබෙන සහ යවන ලිපි කළමනාකරණ පද්ධති කොටස" පමණක් දෙපාර්තමේන්තුව තුළ සියළුම අංශ සඳහා ක්‍රියාත්මක කරන ලදී. මෙය පද්ධති පිහිටුවීමේ කවර ආකෘතියක් සමඟ ගැලපේ ද?
   1). ඍජු පිහිටුවීම 2). සමාන්තර ව පිහිටුවීම 3). නියමුමය පිහිටුවීම 4). අදියරමය පිහිටුවීම.

30. ඉහත 29. හි දී, E-Office සම්පූර්ණ පද්ධතිය ස්ථාපනයට පෙර භාවිතා කරන කාර්යාල සේවක කණ්ඩායමට පද්ධතිය සමඟ කටයුතු කිරීමට අවස්ථාව ලබා දී අදහස් හා යෝජනා ලබා ගැනීමට google පෝරමයක් යොමු කිරීම අයත්වන්නේ පද්ධති පරීක්ෂාවේ කවර අවස්ථාවකට ද?
   1) ඒකක පරීක්ෂාව 2) සමස්ත පරීක්ෂාව 3) පද්ධති පරීක්ෂාව 4) ප්‍රතිග්‍රහණ පරීක්ෂාව





31. දෝෂ පණිවිඩ දැන්වීම හා පාලනය සඳහා භාවිතා වන අන්තර්ජාල නියමාවලිය වන්නේ කවරක් ද?
   1) HTTP 2) FTP 3) CMP 4) TCP /IP

32. අපට ලැබෙන අනවශ්‍ය විද්‍යුත් තැපැල් පණිවිඩ වලින් ලැබෙන ලිපි ගොනුවට (INBOX) බාධාවකින් තොරව පවත්වා ගැනීම සඳහා රූපයේ දැක්වෙන කාර්යය ඉටුකරනු ලබන්නේ,
   1) Inbox 2) Drafts 3) Spam/junk 4) Trash/Deleted

33. Gmail ගිණුමක් හිමි අයෙකුට සිය google ධාවකය තුළ සිට google DOC, google sheet, google slide භාවිත පහසුකම ලැබීම ................................ සඳහා උදාහරණයකි

1) IaaS  2) PaaS  3) SaaS  4) Smpt

34. ග්‍රාෆික මෘදුකාංගයක භාවිතා වන  මෙම මෙවලම භාවිතා කර සිදු කරගැනිම වඩාත්ම යෝග්‍ය කාර්යය වන්නේ,



1) ග්‍රාෆිකය එක එල්ල සැකසීම.
2) ග්‍රාෆිකයේ තොරාගත් කොටසක් වෙනත් තැනක පිටපත් කිරීම.
3) ග්‍රාෆිකය අවශ්‍ය ආකාරයට කප්පාදු කිරීම.
4) ග්‍රාෆිකයක තෝරාගත් කොටසක ප්‍රමාණය වෙනස් කිරීම

35. අංකයේ (number) අගය 6 නම් ලබා දී ඇති ව්‍යාජ කේතයේ ප්‍රතිදානය පුරෝකථනය කරන්න.

```
Read number
k=2; I=2;
  While i<=number
      k=k*I;  I=i+1;
  End while
Write k
```

1) 1440  2) 1340
3) 1700  4) 1560

36. ක්‍රමලේඛනය කිරීමේ දී,

1) විචල්‍යයට අගයක් දුන් පසු වැඩසටහන අවසන් වන තුරු එය නොවෙනස්ව පවතී.
2) නියතයක අගය වැඩසටහන අතරතුර නිතර වෙනස් විය හැක.
3) නියතයක අගය වැඩසටහන ක්‍රියත්මක කිරීමේ දී වෙනස් නොවේ.
4) විචල්‍ය සහ නියත හඳුන්වා දෙන අවස්ථාවේ ම ඒවාට අගයයන් ලබා දීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතුය.

37. count =count +1  ප්‍රකාශනයේ count හි සැබෑ අගය වනුයේ,

1) count  2) count+1  3) =count+1  4) +1

38. සෙවුම් ඇල්ගොරිතමයක්......................... ආදානයක් ලෙස සහ ප්‍රතිදානයක් ලෙස ....................ගනී.

1) ආදානය, ප්‍රතිදානය  2) ගැටළුව, විසඳුම  3) විසඳුම, ගැටළුව  4) පරාමිතීන්, ක්‍රියා අනුපිළිවෙළ

39. පරිගණක භාවිතය හේතුවෙන් අතෙහි මැණික් කටුව ආශ්‍රිතව ඇතිවන තෙරපීම නිසා සිදුවන අතේ ඇඟිලි සහ මැණික් කටුව  ආශ්‍රිත හිරිවැටීම සහ වේදනාව, ................................ ලෙස හැඳින්වේ.

1) මාංශ පේශී සහ අස්ථි ගැටළු  2) කාපල දෝනා සහලක්ෂණය
3) ආතතිය  4) පුනරාවර්ති ආතති පීඩාව

40. සමාජය තුළ සිදුවන තොරතුරු හා සන්නිවේදන ක්‍රියාකාරකම් වලට අදාලව පහත  ප්‍රකාශ සලකන්න.

A- කර්මාන්ත ශාලාව එහි යන්ත්‍ර මගින්, මිනිස් ශ්‍රමය සහ හැකියාවන්ගේ ස්ථානය, අත්පත්කර ගනී
B- අංකිත සේතුවක් ඇති කිරීම සඳහා සැමට පරිගණකයක් හෝ ජංගම දුරකථනයක් හෝ ලබා දීම පමණක් සෑහේ.
C- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT), සයිබර් ආරක්ෂාව පිළිබඳ සමාන්‍ය මහජනතාවට සිදුවන අපහසුතා පිළිබඳ පැමිණිළි කළ හැකි ආයතනයකි

නිවැරදි ප්‍රකාශ/ය දැක්වෙන පිළිතුර තෝරන්න.

1) A පමණි  2) A හා C පමණි  3) B හා C පමණි  4) A, B හා C සියල්ලම

සියලු ම හිමිකම් ඇවිරිණි
All rights reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education Southern Province

4216

තෙවන වාර පරීක්ෂණය මාර්තු 2023
Third Term Test March 2023

11 ශ්‍රේණිය
Grade 11


තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II
Information and Communication Technology II


## දෙවන කොටස

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද ඉතිරි ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් ද ලැබේ.

1.


(i) පහත දැක්වෙන්නේ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිට ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශයට යාම සඳහා රියදුරෙකු, " Google මාර්ග සහයක කෘතිම බුද්ධි යෙදවුම (Google Road Assistant Artificial Intelligence application)" භාවිතා කරන රූප සටහනකි.






රියදුරු ලබා දෙන එක් ආදානයක් සහ ඔහුට ලැබෙන ප්‍රතිදානයක් නම් කරන්න.

(ii) මෙහි දැක්වෙන්නේ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් තොරතුරු හා සන්නිවේදන විෂය අඛන්ඩ තක්සේරුකරණය සඳහා **ULTIMATE – WISDOM** මාර්ගගත තක්සේරු පත්‍රිකාවක තිබු ඇද දැමීම් වර්ගයේ ක්‍රියාකාරකමක රූප සටහනකි.




1 සිට 6 දක්වා අක්ෂර වලින් දැක්වෙන කෙවෙනි වලට ගැලපෙන කෙවෙනි නාමවලට අදාල ලේබල දක්වන අංකය, ලේබලය → අංකය ආකාරයට පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න.

(iii)

**(a)** $1010010111_2$ සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව බවට පරිවර්තනය කරන්න.


**(b)** කළු වර්ණය සඳහා ගැලපෙන අගය නිවැරදි කේත ක්‍රමය මගින් දක්වන්න.

| වර්ණය | වර්ණය | ෂඩ්දශමය අගය | R | G | B |
|---|---|---|---|---|---|
| කළු | | ........................... | 9 | 2 | 23 |


(iv) "අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම 21 වන සියවසේ ප්‍රධාන අංගයක් වේ. ඕනෑම තැනක සිට, ඕනෑම වෙලාවක, කැමති වේගයකින් ඉගෙනීම මෙහි ඇති විශේෂත්වයකි. තවදුරටත් එක් එක් ශිෂ්‍යයා පොදු අතත්‍ය වේදිකාව තුලම වෙන් වෙන්ව ඇගයීමට හා තක්සේරු කිරිමට මෙවැනි LMS ඉගෙනුම් කලමනාකරණ පද්ධති පහසුකම් සපයයි. එමෙන්ම ඉගෙනුම සහ ඉගැන්වීම පිළිබඳ පැතිකඩක් ලෙස ද භාවිතයට ගැනීමට පරිශීලකයන්ට හැකියාව ඇත. නිර්මාණශීලී ක්‍රියාකාරකම් සහ තක්සේරු පත්‍රිකා සැකසීම හා පරිශීලක අනන්‍යතාව රැක ගැනීමට පහසුකම් සැපයීම ද මෙවන් පද්ධතිවල සුවිශේෂිතාවයකි."

ඉහත ඡේදයේ සඳහන් කරුණු අනුව ඉගෙනුම් කළමණාකරන පද්ධතියක් භාවිතා කිරීමේ දී ශිෂ්‍යයාට ඇති වාසියක් හා එහි පරිපාලකයන්ට ඇති වාසියක් ලියන්න.

(v) වීඩියෝ සංස්කරණ මගින් විවිධ පණිවිඩ සහ ඉදිරිපත් කිරීම්, වර්තමානයේ සෑම ක්ෂේත්‍රයක ම දක්නට ඇත. ඒ සඳහා ඔබේ විෂය නිර්දේශයේ හඳුන්වා දී ඇති වින්ඩෝස් මූවිමේකර් Windows Movie Maker මෘදුකාංගයේ අතුරුමුහුණතක කොටසක් පහත දැක්වේ. එහි 1, 2, 3, 4 යනු වීඩියෝ සංස්කරණයේ දී විවිධ කාර්යය ඉටුකර ගන්නා ස්ථාන වේ. එම ස්ථානවල කාර්යයන් A, B, C හා D යටතේ සටහන් කර ඇත. (අනුපිළිවෙලට නොවේ) එම ස්ථාන හඳුනාගෙන, අංකය → අක්ෂරය ආකාරයට ලියන්න.




| |
|---|
| A- පූර්ව දර්ශණ ක්‍රියාකරවීමේ කවුළුවක් (Player Pane) |
| B- කාල තිර වේදිකාව (Time LINE) |
| C- කාර්යය කවුලුව (Task Pane) |
| D- සංස්කරණය සඳහා වීඩියෝ රඳවන ස්ථානය (Video Or Image Dropped Place) |




(vi) මෙම තාර්කික පරිපථය සඳහා ගැලපෙන,

a) බූලියානු ප්‍රකාශනය

b) සත්‍යතා වගුව ගොඩනගන්න.


(vii)

(a) පික්සලයක වර්ණ 65536 ඇති ඡායාරූපයක පික්සලයක අඩංගු බිටු ප්‍රමාණය කොපමණ ද? $(65536=(256)^2)$

(b) JPEG, TIFF, BMP ............................ ගොනු ආකෘති වර්ග කිහිපයක් වන අතර GIF, PNG, RAW ............... ගොණු ආකෘති සඳහා උදාහරණ වේ. (හිස් තැන් සඳහා සුදුසු වචන යොදන්න)

(viii) ඒකාකාර සම්පත් නිශ්චායකයක (URL) අඩංගු කොටස් අනුපිළිවෙළ පහත වගුවේ දැක්වෙන අතර එක්තරා ප්‍රසිද්ධ ඉගෙනුම් ආධාරක වෙබ් අඩවියක ඒකාකාර සම්පත් නිශ්චායකය කොටස් අපිළිවෙළට ඉහත දෙවන රවුමේ දැක්වේ. එම ඒකාකාර සම්පත් නිශ්චායකයෙහි ඉහත වගුවේ දැක්වෙන කොටස් සියල්ල එකතුකර පිළිවෙළට ඔබේ පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න.

| අංකය | කොටස |
|---|---|
| 1 | නියමාවලිය |
| 2 | සේවාව . |
| 3 | වසම්නාමය |
| 4 | සම්පත් පවතින ස්ථානය |
| 5 | සම්පත් ගොනුව |



(ix) පැස්කල් යන වචනය පුනර්කණය වීම සඳහා ලියන ලද පැස්කල් ක්‍රමලේඛයක කොටසක් පහත දැක්වේ.

a) count විචල්‍යයේ ආරම්භක අගය කීය ද?

b) count හි අගය කීයක් වූ විට පුනර්කරණය නවතී ද?

```
count := 0;
Repeat
writeln ('Pascal');
count := count+1;
Until count > 5;
```

(x) "ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය" (Sri Lanka CERT | CC) සම්බන්ධීකරණ මධ්‍යස්ථානයෙන් අපට ලබා ගත හැකි සේවා දෙකක් නම් කරන්න.

2.

(i) A සිට D තෙක් ලේබල් මගින් පෙන්වා ඇති විස්තරයට ගැලපෙන, පහත දී ඇති පද, ලැයිස්තුවේ ඇති පද සමඟ ගලපන්න. ලේබලය→පදයේ අංකය, ආකාරයට පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

| ලේබලය | විස්තරය |
|---|---|
| A | වරකට එක් පරිශීලකයෙකු සම්බන්ධ සේවා සපයන මෙහෙයුම් පද්ධති, ඒකපරිශීලක මෙහෙයුම් පද්ධති ලෙස හැඳින්වේ. |
| B | ගොණු කළමනාකරණයේ දී, ගොනුවක් වෙත සෘජු ප්‍රවේශය, මේ නමින් හැඳින්වේ. |
| C | .accdb දිගුව පවතින ගොනුවක් අයත් වනුයේ මෙම ගොණු වර්ගයටය |
| D | පරිගණකයකට මෙහෙයුම් පද්ධති එකකට වඩා ස්ථාපනය කිරීමට පෙර සිදු කළ යුතු ය. |

(පද ලැයිස්තුව : 1) පංගු බෙදීම 2) සසම්භාවී ප්‍රවේශය 3) ඩොස් 4) වින්ඩොස් 5) ඇක්සස්

(ii) පහත දැක්වෙන වාක්‍ය වල හිස්තැනට සුදුසු පදය නියෝජනය කරන අක්ෂර, ප්‍රශ්න අංකයට අදාලව පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න.

a) රූපවාහිනිය නැරඹීම සහ ගුවන් විදුලියට සවන් දීම ............................දත්ත සම්ප්‍රේෂණය සඳහා උදාහරණයකි.

b) දුරකථන භාවිතය ................................ දත්ත සම්ප්‍රේෂණය සඳහා උදාහරණයකි.

c) දැනට පවතින වේගවත්ම නියමු මාධ්‍යය, දත්ත සම්ප්‍රේෂණ ක්‍රමවේදය ............................ භාවිතයයි.

d) තොරතුරු අදාල පරිගණකයටම පමණක් යොමු කිරීම සහ පූර්ණ ද්විපථ ක්‍රමවේදය නිසා පරිගණක ජාලයක් සඳහා .............................. භාවිතය වඩාත් වාසිදායක වේ.

e) ප්‍රධාන කේබලය හරහා පරිගණක සියල්ල එකිනෙක සම්බන්ධ වන BACKBONE සහිත ජාලස්ථල ආකාරය .................... වේ.

f) ..................පරිගණක ජාල භාවිතා කිරීමේ අවාසියක් ලෙස හැඳින්විය හැක.

(පද ලැයිස්තුව: A- ජාලයේ ඇති ඕනෑම පරිගණකයකින් දත්ත ගබඩාවට සම්බන්ධ වීමට හැකිවීම, B- පූර්ණ ද්විපථ දත්ත සම්ප්‍රේෂණය, C-ඒක පථ සම්ප්‍රේෂණය, D- ස්විචය, E- බසයක ආකාරයට ජාල ගත කිරීම, F-නාභිය, G-ප්‍රකාශ තන්තු, H-තරුවක ආකාරයට ජාලගත කිරීම)

3. 11 ශ්‍රේණියේ ව්‍යාපෘති පාදක අධ්‍යාපනයේ දී, විෂය අතර සහයෝගය මගින් සිසුන්ට අත්දැකීමක් ලබා දීම සඳහා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය දැනුම සහ ගණිත දැනුම එකට මිශ්‍ර කර, කණ්ඩායම් ව්‍යාපෘතියක් සිසුන්ට හඳුන්වා දී ඇත. ගණිතය විෂය යටතේ උපකල්පිත මධ්‍යනය පිලිබඳ දැනුම සහ තොරතුරු තාක්ෂණ විෂයයේ විද්‍යුත් පැතුරුම්පත් දැනුම භාවිතාකර සංඛ්‍යාත ව්‍යාප්තියක මධ්‍යනය සෙවීමට අදාල පැතුරුම්පත් කොටස මෙහි දැක්වේ.

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | පන්ති ප්‍රාන්තරය | මධ්‍ය අගය | අපගමනය(d) | සංඛ්‍යාතය(F) | F(d) |
| 2 | 12_14 | 13 | -9 | 5 | -45 |
| 3 | 15 - 17 | 16 | -6 | 9 | -54 |
| 4 | 18 - 20 | 19 | -3 | 11 | -33 |
| 5 | 21 - 23 | 22 | 0 | 26 | 0 |
| 6 | 24 - 26 | 25 | 3 | 11 | 33 |
| 7 | 27 - 29 | 28 | 6 | 8 | 48 |
| 8 | | | Σf | 70 | -51 |
| 9 | | | | | Σfd |
| 10 | මධ්‍යනයය = උපකල්පිත මධ්‍යනය + අපගමනවල මධ්‍යනය | | | | |

(i) C2 කෝෂයට අදාල අපගමන ලබාගැනීම සඳහා කෝෂ ලිපින භාවිතා කොට ලියන සූත්‍රය කුමක් ද? (ගණනය සඳහා උපකල්පිත මධ්‍යනය අගය 22 ලෙස යොදා ගෙන ඇත. ඒ අනුව අපගමන තීරුව C හි අගය සකස් වන්නේ, = මධ්‍ය අගය අඩංගු කෝෂය - උපකල්පිත මධ්‍යයනය අඩංගු කෝෂය, ලෙස ලියන සූත්‍රය මගිනි.)

(ii) C2 ට ලියන සූත්‍රය C2:C7 ඕනෑම කෝෂයකට පිටපත් කළවිට නිවැරදි අගය ලබාගැනීමට හැකිවන පරිදි නැවත සකස්කර ලියන්න.

(iii) Σf අගය D8 කෝෂයට ලිවීමට සුදුසු සූත්‍රය, = ශ්‍රිතය (කෝෂය1: කෝෂය2) ආකාරයට ලියන්න.

(iv) E තීරුවේ f(d) හි අගය ලබාගැනීමට E2 කෝෂ ලිපින භාවිතා කොට ලිවිය හැකි සූත්‍රය ලියන්න.

(v) Σfd අගය E9 කෝෂයට ලබාගැනීම සඳහා, සුදුසු ශ්‍රිතයක් භාවිතා කොට, = ශ්‍රිතය (කෝෂය1: කෝෂය2) අකාරයට ලියන්න.

(vi) සැබෑ මධ්‍යනාය A10 කෝෂයේ ප්‍රදර්ශනය සඳහා (*Σfd/Σf + උපකල්පිත මධ්‍යනය*) ලබා ගැනීමට A10 කෝෂයට ලියන සූත්‍රය කෝෂ ලිපින භාවිතා කර ලියන්න.

4. පාසල් ලිපිද්‍රව්‍ය අලෙවි සැලක ඇති, අලෙවි මෘදුකාංග තොරතුරු පද්ධතියක (Point of sale - POS) පාසල් උපකරණ පිලිබඳ දත්ත ඇතුලත්කර ඇති ආකාරය පහත දැක්වේ. භාණ්ඩ තොග පවත්වා ගැනීම, මිලට ගැනීම සහ අලෙවි කිරීම යන සියළු කටයුතු මෙම පද්ධතිය හරහා ම සිදුවේ.

මිල දී ගැනීම වගුව

| Product _ID | Agent _ID | Purchase_ price |
|---|---|---|
| CR1001 | SUP001AT | Rs:80 |
| CR1001 | SUP002RT | Rs:85 |
| CR1002 | SUP001AT | Rs:140 |
| CR1002 | SUP003PR | Rs:140 |
| WB1002 | SUP001AT | Rs:550 |
| CR1003 | SUP001AT | Rs:270 |
| CR1003 | SUP003PR | Rs:245 |
| WB1002 | SUP004PR | Rs:600 |

විකුණුම් වගුව

| Product _ID | Product_Name | Selling_ price |
|---|---|---|
| CR1001 | Singlerule CR Page 40 | Rs:145 |
| CR1002 | Squareruled CR Page 80 | Rs:260 |
| CR1003 | Squareruled CR Page120 | Rs:350 |
| WB1002 | Plastic water bottles 1L | Rs:680 |

සැපයුම්කරු වගුව

| Agent _ID | Agent_Name | Agent_City |
|---|---|---|
| SUP001AT | Sajith Stores | Galle |
| SUP002RT | Star Marketing | Matara |
| SUP003PR | School Marketing | Akuressa |
| SUP004PR | Raj Marketing | Imaduwa |

(i)

(a) විකුණුම් වගුවේ ප්‍රාථමික යතුර ලියන්න.

(b) මිළට ගැනීම් වගුවේ ආගන්තුක යතුර ලියන්න.

(ii) විදුලිබිල වැඩිවීමෙන් නිෂ්පාදන වියදම ඉහළ යාම නිසා SUP002RT සැපයුම්කරු CR1003 නිෂ්පාදනයේ මිල රු 20කින් ඉහල නංවන ලදී. ඒ අනුව වෙලඳ සැල එම නිෂ්පාදනයේ මිල රු 20ක් වැඩි කර විකිණීම සිදුකරයි. මේ අලෙවිය කිරීමට යාවත්කාලීන කළයුතු වගුව /වගු මොනවා ද?

(iii) ගාල්ලේ නව සැපයුම්කරුවකුවන (SAKURA Marketing) ආයතනය, කවකටු පෙට්ටි (Mathematical Geometry Box -SUP005MG), මෙම වෙලඳ සැලට සැපයීම සිදුකරයි. එම සැපයුම්කරුගේ භාණ්ඩ අලෙවි කිරීමට පෙර වෙළඳ සැල සිය පද්ධතියේ සිදු කළ යුතු වෙනස්කම්, වගුව → ක්ෂේත්‍රය ආකාරයට ලියා දක්වන්න.


(iv) මෙම වෙලඳ සැලට පිටු 40 CR පොත් සැපයුමකරුවන් පිලිබඳ විමසුමක් ලබා ගැනීමට සම්බන්ධ කළයුතු වගු මොනවා ද?

5.

**(i)** දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් **Ultimate Wisdom G.C.E. (O/L)** තක්සේරු වැඩසටහන සඳහා ලබාදීමට සැකසූ පහත 2 රූපයේ දැක්වෙන සහතික පතෙහි මූලික ආකෘති සැකැස්ම පහත දැක්වේ.

> Ultimate Wisdom G.C.E. (O/L)
> Continuous Assessment
> Certification of Competence Achievement
> This Certificate is awarding to Reference Number ..........................................at ................................... PV/ KV/ MV/ MMV/ NS for successfully completing the course and evaluation for Grade ........... unit ........ in Information and Communication Technology in Learning Management System (Wisdom Cloud LMS) Organized by the Southern Provincial Department of Education
>
> (Information and Communication Technology Unit.)

රූපය 1




රූපය 2

| හැඩසව් ගැන්වීමේ මෙවලමට අදාල නිරූපකය | | 11 A A | Aa | I | |
|---|---|---|---|---|---|
| නිරූපක ලේබලය | P | Q | R | S | T |

**1- 4** දක්වා වෙනස්කම් සිදු කිරීමට යොදා ගෙන ඇති **P, Q, R, S, T** මෙවලම් ලේබල් සහ වෙනස්කමට අදාල වන පරිදි අංකය → ලේබලය ගැලපීම සිදු කරන්න.

**(ii)** රජය මගින් මෑතක දී නිකුත් කර ඇති රාජ්‍ය වියදම් අවම කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ආයතන ක්‍රියාකාරිත්වය අංකිත කිරීමට යෝජනා වී ඇත. ඒ අනුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සිය කාර්යාල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගගත තොරතුරු පද්ධතියක් සකස් කිරීමට යෝජනා විය.

**(a)** දැනට භාවිතා කරන අත්පුරු පද්ධතිය වෙනුවට මෙම මාර්ගගත පරිගණක ගත තොරතුරු පද්ධතිය භාවිතය නිසා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අත්විය හැකි වාසි දෙකක් ලියන්න.

**(b)** ආයතනය තුළ සිදුවන මෙහෙයුම් අනුව ලිපි කළමනාකරණය, අමුත්තන් කළමනාකරණය, කාර්යය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, අධ්‍යාපන කළමනාකරණය යනුවෙන් කොටස් කොට පද්ධතිය නිර්මාණය සුදුසු බව යෝජනා විය. මේ සඳහා සුදුසු පද්ධති සංවර්ධන ආකෘතිය කුමක් ද?

(c) මෙම පද්ධතිය ආයතනයේ පරිපාලන ඒකක ශාඛාවකට භාවිතා කොට එහි සාර්ථකත්වය මත සෙසු අංශ සඳහා භාවිතයට තීරණය කරන ලදී. මෙය කවර පද්ධති පිහිටවීම් ආකෘතියක් ද?

(d) මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා නව පරිගණක 03ක්, ලිපි ස්කෑනරයක් සහ අන්තර්ජාල පහසුකමක් සපයා ගතයුතු බව පද්ධති සැකසුම් කමිටුව පරිපාලනයට දන්වන ලදී . මෙය පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ කවර පියවරකට අයත් කටයුත්තක් ද?

(e) මෙම පද්ධතියේ ක්‍රියාකාරිත්වය, එහි ඇති ගැටළු සහ යෝජනා ලබා ගැනීමට පද්ධතිය භාවිතා කරන්නන් සඳහා තොරතුරු තාක්‍ෂණ ඒකකය මගින් whatsapp සමූහයක් නිර්මාණය කර ඇත. එය පද්ධති පරීක්‍ෂාවේ කවර ආකෘතියක් සඳහා ගැලපේ ද?

6.

(i)

(a) වලාකුළු පරිගණක භාවිතයේ දී platform as a service (PaaS) මගින් සේවාලාභියාට ලැබෙන පහසුකම් තුනක් ලියන්න.


(b) පහත දී ඇති පද ලැයිස්තුවේ නිවැරදි පදය හා ගලපා, එක් එක් පදය අදාළ ලේබලය ඉදිරියෙන්, ලේබලය →පදය ආකාරයෙන් ලියා දක්වන්න.

| | |
|---|---|
| A | වෙබ් අඩවියක් වෙත පරිශීලකයින් දහස් ගණනක් එකවර සම්බන්ධ වීම. |
| B | සේවාලාභී පරිගණකයක ඇති ගොනු අන්තර්ජාලයට මුදා හැරීම (Upload Files) |
| C | සේවාලාභී පරිගණකවල ඇති දෝෂ නිරාකරණය හා නියාමනය |
| D | වසම් නාමය IP ලිපිනය බවට පරිවර්තනය කර දීම |

පද ලැයිස්තුව:{සෙවුම් යන්ත්‍ර, බහුමාධ්‍ය සැපයුම, DNS, IP, ගොනු බෙදා ගැනීම, FTP, දුරස්ථ පිවිසුම, WWW}

(ii) රූපය 1 හි පෙන්වනු ලබන්නේ වෙබ් පිටුවෙහි HTML ප්‍රභවය, එහි සමහර උසුලන නොමැතිව සහ ඒවා 1 සිට 10 තෙක් ලේබල් කිරීමක් සමගින් රූපය 2 හි පෙන්වා ඇත. නිවැරදි උසුලන පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරාගන්න. ඔබ විසින් ලිවිය යුත්තේ එක් එක් ලේබල අංකය සහ ඒ හා ගැළපෙන, දී ඇති ලැයිස්තුවෙන් තෝරාගත් HTML උසුලන පමණි.
ලැයිස්තුව : {*h1, table, tr, font, b, br, h2, colspan, center, title, body, td, rowspan, head, image,* boarder}

DARMAPALA COLLEGE SPORTS TRAINING TIME TABLE



| Day/Time | I 12.00-1.00 | II 1.30-2.30 | III 3.00-4.00 | IV 4.30-5.30 | V 6.00-7.00 |
|---|---|---|---|---|---|
| Monday | Badminton | | volleyball | Cricket | |
| Tuesday | Net Ball | Swimmnig | | | |
| Wednesday | Table Tennis | | Chess | | |

රූපය 1

```
<html>
<① ><②>Time Table</②></①>
<③><H1><⑦ COLOR="DARKCYAN"><CENTER>DARMAPALA COLLEGE SPORTS TRAINING   TIME
TABLE </CENTER></⑦></H1>
  <④align="center">
      <⑨>
       <td><⑤src="sport1.jpg" width="200" height="150"></td>
       <td><⑤ src="sport3.jpg" width="200" height="150"></td>
       <td><⑤ src="sport2.jpg" width="200" height="150"></td>
      </⑨>
  </④>
  <④ ⑥="5" cellspacing="0" align="center">
      <⑨>
       <td align="center" height="50" width="100"><br><⑩10>Day/Time</⑩></br></td>
       <td align="center" height="50" width="100"><⑩>I<br>12.00-1.00</⑩></td>
       <td align="center" height="50" width="100"><⑩>II<br>1.30-2.30</⑩></td>
       <td align="center" height="50" width="100"><⑩>III<br>3.00-4.00</⑩></td>
       <td align="center" height="50" width="100"><⑩>IV<br>4.30-5.30</⑩></td>
       <td align="center" height="50" width="100"><⑩>V<br>6.00-7.00</⑩></td>
      </⑨>
      <⑨>
       <td align="center" height="50"><⑩><⑦ COLOR="Green">Monday</⑦ ></⑩></td>
       <td ⑧="2" align="center" height="50">Badminton</td>
       <td align="center" height="50">volleyball</td>
       <td ⑧="2" align="center" height="50">Cricket</td>
      </⑨>
      <⑨>
       <td align="center" height="50"><⑩><⑦ COLOR="Green">Tuesday</⑦ ></⑩></td>
       <td align="center" height="50">Net Ball</td>
       <td ⑧="4" align="center" height="50">Swimming</td>
      </⑨>
      <⑨>
       <td align="center" height="50"><⑩><⑦ COLOR="Green">Wednesday</⑦></⑩></td>
       <td ⑧="2" align="center" height="50">Table Tennis</td>
       <td ⑧="3" align="center" height="50">Chess</td>
      </⑨>
  </④>
</③>
</html>
```

රූපය 2


7.

**(i)** පහත දී ඇති ගැලීම් සටහන, දී ඇති උපදෙස් අනුව නිවැරදි කළ පසු ගැලීම් සටහන කුමන ආකාර වේ ද? ඇඳ දක්වන්න.

**A.** මෙම පුද්ගලයා නිවසින් පිට වීමට පෙර හිස්වැස්මක් පැළඳ ගනී

**B.** වෙලාව 7ට පෙර නම් ඔහු ආහාර ලෙස බත් ආහාරයට ගනී.

**C.** වෙලාව 7ට පසු නම් ඔහු ආහාර ලෙස බනිස් ආහාරයට ගනී.




**(ii)** පැස්කල් ක්‍රමලේඛනය තුළ දත්ත තැන්පත් කිරීම සඳහා භාවිතා කරන තවත් ආකාරයක් ලෙස අරාව පෙන්වා දිය හැකිය.

**(a)** සංඛ්‍යාත්මක අගයයන් 6ක් ඇතුළත් කළ හැකි **"prices"** අරාව නිර්මාණය කිරීමට භාවිත කරන පැස්කල් කේතය ලියා දක්වන්න.

**(b)** පහත උපදෙස් අනුව අරාව තුළ දත්තවල හැසිරීම පිළිවෙළින් ඇඳ දක්වන්න

i. **prices[1]:= 35;**
   **prices[5] := 76;**

ii. **prices[3] := prices[1] + 27;**

iii. **prices[6] := prices[5] + prices[3];**

iv. **prices[4] := prices[6] -100 ;**

v. **prices[2] := prices[4];**
   **prices[3] := prices[4] + prices[6];**

**තෙවන වාර පරීක්ෂණය 11 ශ්‍රේණිය 2023**

Third Term Test Grade 11 2023

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I, II පිළිතුරු**

Information and Communication Technology I, II Answers

**I කොටස / Part 1**

| ප්‍රශ්න අංකය / Q No. | පිළිතුර / Answer | ප්‍රශ්න අංකය / Q No. | පිළිතුර / Answer | ප්‍රශ්න අංකය / Q No. | පිළිතුර / Answer | ප්‍රශ්න අංකය / Q No. | පිළිතුර / Answer |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 4 | 21 | 4 | 31 | 3 |
| 2 | 2 | 12 | 4 | 22 | 2 | 32 | 3 |
| 3 | 1 | 13 | 4 | 23 | 1 | 33 | 3 |
| 4 | 2 | 14 | 2 | 24 | 2 | 34 | 4 |
| 5 | 3 | 15 | 4 | 25 | 1 | 35 | 1 |
| 6 | 2 | 16 | 2 | 26 | 1 | 36 | 3 |
| 7 | 2 | 17 | 3 | 27 | 1 | 37 | 1 |
| 8 | 4 | 18 | 3 | 28 | 3 | 38 | 2 |
| 9 | 3 | 19 | 1 | 29 | 4 | 39 | 2 |
| 10 | 4 | 20 | 3 | 30 | 4 | 40 | 2 |

II කොටස - පිළිතුරු

1.

i). ආදානය:- ආරම්භක ස්ථානය, ගමන අවසාන කරන ස්ථානය.

ප්‍රතිදානය:- ගමනේ දුර, ගතවන කාලය හෝ වෙනත් නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න. ( ලකුණු 02)

ii). A—4, B---3, C--- 2, D----6, E---5, T----1 **( ලකුණු 02)**

iii).

a). 633

b). 090217 **( ලකුණු 02)**

**iv).** ශිෂ්‍යයාට - **ඕනෑම තැනක සිට, ඕනෑම වෙලාවක, කැමති වේගයකින් ඉගෙනීම.**

ගුරුවරයාට - එක් එක් ශිෂ්‍යයාවෙන් වෙන් වෙන්ව ඇගයීම. **( ලකුණු 02)**

v). 1 - C ,2 – D, B– 3,4--A

**vi).**

a). $\overline{A.B.C}$ **( ලකුණු 02)**

b). **සත්‍යතා වගුව**

| A | B | C | Q |
|---|---|---|---|
| 0 | 0 | 0 | 1 |
| 0 | 0 | 1 | 1 |
| 0 | 1 | 0 | 1 |
| 0 | 1 | 1 | 1 |
| 1 | 0 | 0 | 1 |
| 1 | 0 | 1 | 1 |
| 1 | 1 | 0 | 1 |
| 1 | 1 | 1 | 0 |

**vii). a)16 b) හානිවන / හානි නොවන** **( ලකුණු 02)**

viii). https://www.w3schools.com/html/html_links.asp

ix).

a). 0 b). 6 **( ලකුණු 02)**

x). වෛරී තැපැල හෝ තර්ජනාත්මක විද්‍යුත් තැපැල් විමර්ශනය කිරීම

**පරිගණක අපරාධ සිද්ධිය විමර්ෂණය** කර හඳුනා ගැනීමට සහ එම සිද්ධියේ බරපතලකම තක්සේරු කිරීමට **(වෙනත් ගැලපෙන පිළිතුරු සඳහා නිවැරදි ලකුණු දෙන්න.)**

**(ලකුණු 2*10=20)**

**2.**

**A – 3, B-2, C- 5 , D-1** **(ලකුණු 1*4=4)**

a). **C** b). **B** c). **G** d). **D** e). **E** f). **A** **(ලකුණු 1*6=6)**

**3.**

**i). B2-B5** (ලකුණු 2)

**ii). B2-B$5** (ලකුණු 2)

**iii). =SUM(D2:D7)** (ලකුණු 1)

**iv). =C2*D2** **(ලකුණු 1)**

**v). = SUM(E2:E8)** **(ලකුණු 2)**

**vi). = E8/D9+B5** **(ලකුණු 2)**

4.

i). a)Product _ID+ Product_Name (ලකුණු 2)
b)මිල දී ගැනීම වගුව -Agent _ID, Product_ID (ලකුණු 2)

ii). මිල දී ගැනීම වගුව , විකුණුම් වගුව (ලකුණු 2)

iii). සැපයුම් කරු වගුව, මිල දී ගැනීම් වගුව (ලකුණු 2)

iv). මිල දී ගැනීම වගුව - සැපයුම්කරු වගුව (ලකුණු 2)

5.

i). 1---- T 2----- Q 3---- S 4------R (ලකුණු 1*4=4)

ii).

a). අඩු කාලයකින් තොරතුරු සකසා ගත හැකි වීම, සුළු ඉඩ කඩ ප්‍රමාණය විශාල තත්ත ප්‍රමාණයක ගබඩාකරගත හැකිවීම. , උපස්ත ලබා ගැනීම පහසුවීම (වෙනත් ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු දෙන්න) **(ලකුණු 2)**

b). පුනර්කරණ වෘද්ධි ආකෘතිය. **(ලකුණු 1)**

c). නියමුමය පිහිටවීම. **(ලකුණු 1)**

d). විසඳුම් සැලසුම්කිරිම. **(ලකුණු 1)**

e). ප්‍රතිග්‍රහණ පරීක්ෂාව. **(ලකුණු 1)**

6.

i).

a). මෙහෙයුම් පද්ධතිය, පරිගණක භාෂා පද්ධතිය, දත්ත සමුදාය, සේවාදායක පරිගණක

**(ලකුණු 3)**

b). A- ගොනු බෙදා ගැනීම B- FTP C- දුරස්ථ පිවිසුම D- **DNS** **(ලකුණු 2)**

ii). ① - head ② - title ③-body ④ - table ⑤ - img ⑥ - border ⑦ - FONT ⑧ - colspan ⑨ - tr ⑩ - b

**(ලකුණු 1/2*10 = 5)**

7.

i). නිවැරදි සටහන තුළ

Start / begin සහ end ඇතුලත් කර තිබිය යුතුය.
start වලින් පසු "හිස්වැස්මක් පැළඳීම " ඇතුලත් විය යුතුය.
ඉන් පසු "නිවසින් පිටවීම" සිට අනිකුත් කොටස් තිබිය යුතුය.
"Before 7am" හි YES ඊතලය "බත් ආහාරයට ගනී" යන්න "දුම්රියට යාම "ට ප්‍රථම තිබිය යුතුය.
"Before 7am" හි NO ඊතලය "බනිස් ආහාරයට ගනී" යන්න "බසයට යාම "ට ප්‍රථම තිබිය යුතුය.

**(ලකුණු 3)**

ii).

a). var prices: array [0..6] of integer; **(ලකුණු 2)**

b).

| [0] | [1] | [2] | [3] | [4] | [5] | [6] |
|---|---|---|---|---|---|---|
| | 35 | | | | 76 | |
| | 35 | | 111 | | 76 | |
| | 35 | | 111 | | 76 | 187 |
| | 35 | | 111 | 87 | 76 | 187 |
| | 35 | 87 | 274 | 87 | 76 | 187 |
| | | | | | | |

**(ලකුණු 5)**